Prepared by – M.B.I.G.kumari
R/Sumana Balika Vidyalaya

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතාව 08 ඃ නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 8.1ඃ නර්තන කලාව හා සබැඳි ආනුෂංගික අංග පිළිබඳ තොරතුරු විමසුමට ලක්කරයි.

ක්‍රියාකාරකම් 8.1.2 ඃ ශාන්තිකර්ම හා නූතන වේදිකාව ඇසුරෙන් ආලෝකකරණය පිළිබඳ තොරතුරු රැස් කරමු.

- **නිවැරදි පිළිතුරු තෝරන්න.**

1. ප්‍රාථමික මිනිසා රැගුමකට ආලෝකය සපයාගත් ප්‍රථම මෙවලම,

   (i).පොල් පන්දම (ii). ගිණිමැලය (iii). කාල පන්දම (iv).හිරු එළිය

2. පොල් පන්දම නිර්මාණයේ දී උඩ කොටස කපා ඉවත්කරගත් පොල් ගෙඩිය තුළට ඇතුලු කරන කුඩා පන්දම නිර්මාණය සඳහා යොදා ගන්නේ,

   (i).පාන්කඩ (ii). ඉටිපන්දම (iii).පහන (iv). බල්බය

3. දෙවොල් දෙවියන් ලක්දිවට පැමිණි නැවේ කුඹ ගස සිහිවීම සඳහා දෙවොල් මඩු ශාන්ති කර්මයේ දී ,

   (i).කප් සිටුවීම කරයි (ii). මල් පන්දම් නැටීම කරයි
   (iii). කාල පන්දම සිටුවීම කරයි (iv).දෙවොල් ගොඩබැසීම කරයි

4. කුවේණි අස්න නර්තනයේ දී අතෝරකරු රැගෙන යන පන්දම ............ නමින් හඳුන්වයි.

   (i).අත්පන්දම (ii). විලක්කු පන්දම (iii). පොල්තෙල් පන්දම (iv). කාල පන්දම

5. පුවක් ගසක් පිරිසිදු කර ගොප් කොළවලින් සරසා පන්දමක් ගස මුදුනේ බැඳ සකස් කරගනු ලබන්නේ,

   (i). පොල් පන්දමයි (ii). අයිලයයි (iii). මල් යහනයි (iv). කාල පන්දමයි.

- **හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .**

6. යක් ඇනුම නර්තනයේ දී යක් දෙස්සෝ ....................................................................... අතින් ගෙන නර්තනයේ යෙදෙති.

7. පන්දම් සරඹ දක්වමින් නැටීම සඳහා සකස් වූ පන්දම් පද නර්තන අංගයක් පහතරට හා ................................................. ශාන්ති කර්මවල භාවිතා වේ.

8. යක් කෝවිල්වල දී යකුන් උදෙසා ..............................................දැල්වීම සිදු කරයි.

9.මහසෝන් සමයම සහ කළු කුමාර සමයමට අයත් අවතාර බැලීමේ දී ................................................ බැඳ නටනු ලබයි.

10.සොකරි නාටක රංග භූමිය ..................................................................... නමින් හඳුන්වයි.

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

11.'' විලක්කු'' යන්න පැහැදිලි කරන්න.

12. අතීතයේ දී ශාන්ති කර්ම රංගභූමියට අවශ්‍ය ආලෝකය සපයාගෙන ඇති ආකාරය විස්තර කරන්න .

13. ගැමි නාටක රංගභූමිය සඳහා ආලෝකය සපයාගත් ආකාරය ''සොකරි ගැමි නාටකය'' ඇසුරින් පැහැදිලි කරන්න .

14. නර්තනය හා බැඳි අවස්ථා තීව්‍ර කර දැක්වීමට සාම්ප්‍රදායික ඇඳුරන් භාවිත කර ඇති විධික්‍රම හඳුන්වා දෙන්න .